"කාර්යක්ෂමතාවයෙන් යුත් ඵලදායී පළාත් සභා රාජ්‍ය සේවයක්"

ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව
ஊவா மாகாண சபை அரசாங்க சேவை ஆணைக்குழு
Uva Provincial Council Public Service Commission

අංක 14/4, පිලිපොතගම පාර,පිංඅරාව බදුල්ල. இல 14/4,பீலிபொத்தகம வீதி,பிங்கராவ,பதுளை. No 14/4,Peelipothagama Road, Pinarawa,Badulla.

මගේ අංකය / எனது இல / My No. 3/3/2/6/ (273)    ඔබේ අංකය / உமது இல / Your No. ..........    දිනය / திகதி / Date 2025.02.11

ලේකම්, ඌව පළාත් සෞඛ්‍ය හා සමාජ සුභසාධන අමාත්‍යාංශය,

අධ්‍යක්ෂ, ඌව පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව,

**ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ සමාජ සේවා දෙපාර්තමේන්තුවේ සමාජ සේවා නිලධාරී තනතුර සඳහා වන පළමු හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාග - 2025**

ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ, සමාජ සේවා දෙපාර්තමේන්තුවේ සමාජ සේවා නිලධාරී I හා II ශ්‍රේණි වල තනතුරු දරන නිලධාරීන් සඳහා අනුමත සේවා ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට අනුකූලව පැවැත්වීමට නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාග මෙම වර්ෂයේ පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. මෙම විභාගය බදුල්ල නගරයේදී පමණක් පවත්වනු ලැබේ.

03. පළමුවරට විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතෙකුදු වුවත් ඉන්පසු වාර වලදි අපේක්ෂකයින් විසින් එකවර සම්පූර්ණ විභාගයට පෙනී සිටින්නේ නම් විභාග ගාස්තු වශයෙන් රු.400.00 ක මුදලක් ද, එක් විෂයයක් සඳහා පෙනී සිටින්නේ නම් රු.200.00 ක මුදලක් ද ඌව පළාතේ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට *"ඌව පළාත් ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 20.03.02.13ට"* බැර වන පරිදි ගෙවිය යුතුය. එසේම මොනම කරුණක් යටතේ වුවද ඉහත විභාග ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ඉඩ දෙනු නොලැබේ.

04. මෙම විභාග පැවැත්වීම සම්බන්ධයෙන් මෙම කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත් විය යුතු වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකේ.

05. මෙම විභාග සඳහා ඉදිරිපත් වන නිලධාරීන්, https://exams.psc.up.gov.lk/ වෙබ් සබැඳිය ඔස්සේ මාර්ගගත අයදුම් කිරීමේ ප්‍රවේශය වෙත පිවිස 2025.02.28 දින හෝ ඊට පෙර විභාගය සඳහා මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කළ යුතු අතර, එම අයදුම්පත සම්පූර්ණ කර පද්ධතියට යොමු කළ (Submit) පසුව අයදුම්පතේ මෘදු පිටපත බාගත (මෙනුවෙහි Application වෙත පිවිසෙන්න) කර ගත යුතුය. බාගත කර ගන්නා ලද අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගෙන විභාගය සඳහා විභාග ගාස්තු ගෙවා ඇත්නම් එම මුදල් ගෙවන ලද කුවිතාන්සිය ද නියමිත ස්ථානයේ අලවා, අදාල අයදුම්පත තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් 2025.03.07 දින හෝ ඊට පෙර **"ලේකම්, ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 14/4, පිලිපොතගම පාර, පිංඅරාව, බදුල්ල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ සමාජ සේවා නිලධාරීන් සඳහා වන පළමු/ දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025"** යනුවෙන් සඳහන් කරන්න.

06. එසේම, මාර්ගගත පද්ධතිය ඔස්සේ විධිමත්ව සම්පූර්ණ නොකරන ලද හා අසම්පූර්ණ තොරතුරු සහිත හෝ වැරදි සහිත, අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පසු ඉදිරිපත් කරනු ලබන සියලු අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත්‍රයේ හා මුදල් ගෙවා ලබා ගන්නා ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම අයදුම්කරුවන්ට ප්‍රයෝජනවත් වනු ඇත.

7

2 පිටුවට...

සභාපතිතුමා / தலைவர் / Hon. Chairman 055 - 2222150 | ලේකම් / செயலாளர் / Secretary 055 - 2223482 | පොදු / பொது / General 055 - 2222400

සහකාර ලේකම් / உதவி செயலாளர் / Asst.Secretary 055 - 2225148, 055 - 2232857(Exam) | පරිපාලන නිලධාරී / நிர்வாக உத்தியோகத்தர் / Administrative Officer 055 - 2222400 | Fax - 055-2232858 | Website - www.up.gov.lk/psc | E-mail - uppscb@gmail.com

07. සියලු විභාග අපේක්ෂකයින් විභාග දිනයේදී තම අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත.

II. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

III. වලංගු රියදුරු බලපත්‍රය.

08. එක් එක් ශ්‍රේණියට අදාල කාර්යක්ෂමතා කඩඉම් විභාග සඳහා වන ප්‍රශ්න පත්‍ර සංඛ්‍යාව හා ඊට අදාල විෂයය නිර්දේශයන් පහත දැක්වේ. එසේම, කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්වීම සඳහා එක් එක් විෂයයට ලකුණු 40% ක් ලබා ගත යුතු වේ.

**(අ) පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය**

මෙම පරීක්ෂණය II වන ශ්‍රේණියට පත් වී/ අන්තර්ග්‍රහණය වී වසර 03ක් ඇතුළත සමත් විය යුතුය.

මෙය ලිඛිත පරීක්ෂණයකි.

ප්‍රශ්න පත්‍ර (2) දෙකකින් යුක්තය.

| විෂයය අංකය | විෂයය හා විෂයය නිර්දේශය | කාලය | මුළු ලකුණු |
|---|---|---|---|
| 01 | **කාර්යාල ක්‍රම, ආයතන සංග්‍රහය සහ ඌව පළාත් සභා මුදල් රීති සංග්‍රහය**<br>රජයේ කාර්යාල වල භාවිතා වන කාර්යාල ක්‍රම පිළිබද මූලික දැනුම හා එම දැනුම ප්‍රායෝගිකව භාවිතා කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම හා රාජකාරි ලිපි ලේඛන මැනවින් අවබෝධ කොට ගෙන පැහැදිලි හා සංක්ෂිප්ත සටහන් මගින් තම අදහස / නිරීක්ෂණ නිශ්චිත අන්දමින් ඉදිරිපත් කිරීමේ හැකියාව පරීක්ෂා කෙරේ.<br><br>ආයතන සංග්‍රහයේ VI, VII, IX, XII, XIX, XXIII, XXV, XXVI, XXVII, XXVIII, XXIX, XXX, XXXI, XXXII, XXXIII පරිච්ඡේද ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ කාර්ය පටිපාටික රීති සංග්‍රහය, ඌව පළාත් රාජ්‍ය සේවයේ විනය කාර්ය සංග්‍රහය පිළිබඳ සාමාන්‍ය අවබෝධය අපේක්ෂා කෙරේ.<br><br>ඌව පළාත් සභා මුදල් රීති සංග්‍රහයේ I, II, III, IV, VI වැනි පරිච්ඡේද වල මූලික අවබෝධය මත සැකසේ. | පැය 02 | 100 |
| 02 | **සමාජ සේවා සහ සමාජ සංවර්ධන නීතිරීති හා රෙගුලාසි**<br>ඌව පළාත තුළ සමාජ සේවා හා සමාජ සංවර්ධන කටයුතු හා ඒ හා සම්බන්ධ නීතිරීති හා ක්‍රියාමාර්ග පිළිබඳව අවබෝධය පරීක්ෂා කිරීම සඳහා සකස් කල ව්‍යුහගත ප්‍රශ්න. | පැය 02 | 100 |

**(ආ) දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය**

මෙම පරීක්ෂණය I වන ශ්‍රේණියට පත් වී/ අන්තර්ග්‍රහණය වී වසර 05ක් ඇතුළත සමත් විය යුතුය.

මෙය ලිඛිත පරීක්ෂණයකි.

ප්‍රශ්න පත්‍ර (2) දෙකකින් යුක්තය.

3 පිටුවට...

| විෂයය අංකය | විෂයය හා විෂයය නිර්දේශය | කාලය | මුළු ලකුණු |
|---|---|---|---|
| 01 | **කළමනාකරණ මූලධර්ම හා භාවිතය**<br>කළමනාකරණ මූලධර්ම හා භාවිතය පිළිබඳ මූලික අවබෝධය පරීක්ෂා කිරීමේ ව්‍යුහගත ප්‍රශ්න. | පැය 03 | 100 |
| 02 | **සමාජ සේවා සහ සමාජ සංවර්ධන විෂයයට අදාල සිද්ධි අධ්‍යයනය**<br>සමාජ සංවර්ධන වැඩසටහන්, ආබාධිත පුද්ගලයන් සම්බන්ධ ගැටළු, නිවාස හානි සඳහා සහන සැලසීම, මහජනාධාර හා රෝගාධාර ලබාදීම, වැඩිහිටි නිවාස, ස්වේච්ඡා සංවිධාන ආශ්‍රිත විවිධ සේවා ආදිය පිළිබඳ ගැටළු. | පැය 03 | 100 |

09. මෙම විභාග සිංහල, දෙමළ මාධ්‍යයන් ගෙන් පවත්වනු ලැබේ. අයදුම්කරුවන් ඉදිරිපත් වන විෂයයන් සියල්ලම සඳහා එකම භාෂා මාධ්‍යයකින් පෙනී සිටිය යුතු අතර, විභාගයට ඉල්ලුම් කළ යුත්තේ පත්වීම් ලැබූ භාෂා මාධ්‍යයෙනි. කිසිඳු හේතුවක් මත විභාගයට ඉල්ලුම් කළ භාෂා මාධ්‍යය පසුව වෙනස් කරනු නොලැබේ.

10. විභාග පැවැත්වීමට අවම වශයෙන් දෙසතියකට පෙර ප්‍රවේශ පත්‍ර ඊමේල් (Email) මගින් එවනු ලබන අතර, විභාගයට අයදුම් කිරීමේ දී විද්‍යුත් තැපැල් ලිපිනය (Email Address) නිවැරදිව සඳහන් කළ යුතුය. විභාග දිනට සතියකට පෙර ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් ඒ බව තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අයදුම්පත්‍රයේ සහතික කළ ඡායා පිටපතක්, මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ පිටපතක් ද, ප්රවේශ පත්‍රය එවීම සඳහා වට්සැප් (WhatsApp) අංකයක් ද සඳහන් කරමින් ඉල්ලීමක් කළ යුතු වේ. මීට අමතරව https://exams.psc.up.gov.lk/admission/ සබැඳිය මගින්ද විභාග ප්‍රවේශ පත්‍රය බාගත කර ගැනීමට පහසුකම් සලසනු ඇත.

11. මේ පිළිබඳව තම ආයතනයට/දෙපාර්තමේන්තුවට අනුයුක්තව සේවය කරනු ලබන උක්ත තනතුරට අදාල සියලුම නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි. එසේම මෙම විභාගය සඳහා අයදුම්පත් ඉදිරිපත් කරන නිලධාරීන් ඌව පළාත් සභා රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කර ඇති /මෙම පළාත් සභා රාජ්‍ය සේවය යටතේ පත්වීම් ලබා ඇති නිලධාරීන් බවට අදාල ආයතන/දෙපාර්තමේන්තුවට ප්‍රධානීන් පෞද්ගලිකවම සහතික කර තිබිය යුතුය.

12. මෙම විභාග පැවැත්වීම/නොපැවැත්වීම හෝ මෙම නිවේදනය මගින් ආවරණය නොවන කිසියම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් අවසන් තීරණයක් ගැනීමේ අයිතිය ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

කොමිෂන් සභාවේ නියමය පරිදි,

(ගාමිණී මහින්දපාල ජෝපියස්)
ලේකම්
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව